සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය **DSD/HO/05/ 01/**චක්‍රලේඛ
எனது இல
My No

ඔබේ අංකය
உமது இல
Your No

දිනය 2020.03.23
திகதி
Date

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ -2020/04

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් ,

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන්,

පාලක මණ්ඩල සභාපතිවරුන් වෙත.

<u>සමෘද්ධි සහනාධාරලාභීන් සඳහා ”සහන පියවර” ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම.</u>

01 හැදින්වීම

දැනට ව්‍යාප්ත වෙමින් පවතින කෝවිඩ්-19 හෙවත් නව කොරෝනා වෛරසය මැඩපැවැත්වීම සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් මත පිහිටුවා ඇති ජනාධිපති විශේෂ කාර්ය සාධන බලකාය ඇතුළු රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ සමාන්‍ය ආර්ථික කටයුතු සුපුරුදු පරිදි පවත්වාගෙන යාම අපහසු වීම හේතු කොට ඔවුන්ගේ ආදායම් තත්වය අස්ථාවර වීම මත දෛනික ජීවන තත්වයටද බලපෑම් ඇතිවිය හැකිය.

එයට විසඳුමක් ලෙස සමෘද්ධි සහනාධාර ලබන අනිවර්ය ඉතිරිකිරීම් ගිණුම් හිමියන් සඳහා සුවිශේෂ සහන සහිත ණය ප්‍රධානයක් ලබාදීමේ අරමුණින් **`සහන පියවර'** ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙනු ලැබේ.

02 ඉලක්ක පිරිස

දැනට සමෘද්ධි සහනාධාර ලබන අනිවාර්ය ඉතිරිකිරීම් ගිණුම් හිමියන්.

03 උපරිම ණය මුදල හා අවශ්‍යතාවය

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி.செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
Tel- 011-2871672/2872202
Fax - 011-2889002
E-mail- dg@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (පාලන හා ආයතන)
பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்)
Director (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
பணிப்பாளர் (குறு நிதி)
Director (Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය
அலுவலகம்
Office
0112872202

Hot Line: 011- 2887722

උපරිම ණය මුදල රු.10000.00 කි. එක් වරකට උපරිම රු.5000 ක් වන සේ ණය මුදල අවස්ථා දෙකක් තුළ මුදාහැරිය යුතුය. පාරිභෝගික හා හදිසි අවශ්‍යතා වෙනුවෙන් ණය නිකුත්කල යුතුය.

04 පොලී අනුපාතය හා ආපසු ගෙවීම් කාලසීමාව

මෙම ණය මුදල පොලී රහිතව නිකුත් කරන අතර ලබාදෙන සහන කාලය මාස 06 කි. එම සහන කාලයෙන් පසු මාස 12 ක් තුල මාසික වාරික වශයෙන් පොලී මුදලක් නොමැතිව අය කර ගැනීමට කටයුතු කල යුතුය.

05 ඇප සුරකුම්

අනිවාර්ය ඉතිරිකිරීම් ගිණුමේ ශේෂය (නිකුත් කරන ණය මුදල අදාල දිනට පවතින ශේෂයෙන් 80% ක් විය යුතුය.) ඇප සුරකුමවේ. වෙනත් ඇප සුරකුම් ලබාගැනීම අවශ්‍ය නොවේ.

06 **ණය ඉල්ලුම් පත්‍රය හා අනෙකුත් ලියවිලි**

ඇමුණුම 01 මගින් හඳුන්වාදෙන ණය ඉල්ලුම්පත්‍රය භාවිතා කළයුතුය. අනෙකුත් දෑ සඳහා දැනට හඳුන්වා දී ඇති ලියවිලි භාවිතා කළයුතුය.

07 ණය අනුමත කිරීම් හා මුදාහැරීම්

- පාලක මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව ණය නිකුත් කළ යුතුය.
- පොදු ලෙජරයේ කේත අංක.3124 යටතේ **ලැබියයුතු ණය ගිණුම සහන පියවර** නමින් නව ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යා යුතුය.
- මෙම ණය වැඩසටන සඳහා ණය සහ සමූහ සංරක්ෂණ වැඩසටහන් වල දායකත්වය අවශ්‍ය නොවේ.

08 දැනට ව්‍යාප්ත වෙමින් පවතින රෝගී තත්වයෙන් බැංකු කාර්ය මණ්ඩලය හා ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම අරමුණින් පහත පරිදි **මුදාහැරීම්** කටයුතු කළ යුතුය.

- ණය අවශ්‍ය කරන සමෘද්ධි ලාභීන් සඳහා ණය ඉල්ලුම්පත්‍ර වසම් භාර නිලධාරීන් හෝ ප්‍රජාමූල සංවිධානවල සභාපති/ ලේකම් මගින් නිකුත් කල යුතුය.
- නිවැරදිව සම්පූර්ණ කරන ලද ණය ඉල්ලුම් පත්‍ර වසම් භාර නිලධාරීන් මගින් රැස්කර ගත යුතුය. ඒ සඳහා ප්‍රජාමූල සංවිධානවල සභාපති / ලේකම්ගේ සහය අදාල නිලධාරියා වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.
- සුදුසුකම් ලත් ගිණුම් හිමියන් සඳහා ණය මුදලට අදාල මුදල් වසම් භාර සමෘද්ධි නිලධාරීන් භාරයට පත් කළයුතුය. එහිදී අදාල මුදල් නිලධාරියා විසින් භාරගත් බවට රෙජිස්තරයක සටහන් කර අත්සන ලබාගත යුතුය. තවද සමෘද්ධි බැංකුව හරහාද ණය ලාභියා වෙත ණය නිකුත් කිරීමට අවසර ඇත.
- නිකුත් කළ ණය මුදල වසම් භාර නිලධාරියා විසින් නියමිත ගිණුම් හිමියා වෙත භාරදුන් බවට හා භාරගත් බවට අත්සන් සහිත ලියවිල්ලක් ලබාගත යුතුය. ඒ සඳහා අවශ්‍ය ලියවිල්ල බැංකුව විසින් පිළියෙල කර ලබාදිය යුතුය. මේ සඳහා මුදල් හර පත්‍රයද භාවිතා කළ හැකිය.
- මුදල් භාරදුන් බවට වූ සහතිකය දින 03 ක් ඇතුළත කළමණාකරු වෙත භාරදියයුතු අතර ඒ සම්බන්ධව පවත්වා ගෙන යන ඉහත රෙජිස්තරයේ සඳහන් කළ යුතුය. තවද එම සහතික බැංකුවෙහි සුරක්ෂිතව ගොනුකර තැබියයුතුය.

09 මෙම ණය වැඩසටහන යටතේ ණය නිකුත් කිරීම සඳහා අවශ්‍ය කරන අරමුදල් ග්‍රාමීය ණය අවශ්‍යතා ගිණුමෙහි (කේත අංක 4033) ඇති ශේෂය පදනම් කරගත යුතුය.ණය මුදා හැරීමට මුදල් නොමැති විටක, දැනටමත් ආයෝජන කර ඇති මුදල් ලබා ගැනීමට ඉඩ දෙනු ලැබේ.

10 **සුපුරුදු පරිදි ආයෝජනය සඳහා ක්ෂුද්‍රමූල්‍ය අංශයට එවනු ලබන අනිවාර්ය ඉතිරිකිරීම්** අරමුදල් සඳහා පොලී ආදායම ගෙවන බවට තව දුරටත් දන්වමි.

11 මෙම ණය වැඩසටහන යටතේ මුදාහරින ණය මුදල් පිළිබඳ ප්‍රගතිය සතියකට වරක් දිස්ත්‍රික් සමෘද්ධි අංශයටද සති දෙකකට වරක් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට bank@samurdhi.gov.lk විද්‍යුත් ලිපිනය හරහා එවීමටද කටයුතු කළ යුතුය.

12 මෙම ණය වැඩසටහන යටතේ බැංකුවට හා වසම් භාර නිලධාරීන් විසින් මුදල් ක්ෂේත්‍රයට රැගෙන යාමේදී ඇතිවන අවධානම් තත්වය වලක්වා ගැනීමට මාර්ගස්ථ මුදල් රක්ෂණ වැඩසටහන යටතේ ආවරණය ලබා දීමට කටයුතු කරන බවද දන්වමි.

13 මෙම ණය පහසුකම ලබාදෙනු ලබන්නේ, අප විසින් විශේෂයෙන් රැකබලා ගතයුතු පිරිසක් වන සමෘද්ධි ප්‍රතිලාභීන් හට බැවින් ද, අද වන විට විශේෂයෙන් පත් කරන ලද ජනාධිපති විශේෂ කාර්ය සාධන බලකාය හා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග වලට සහය දැක්වීමක් වශයෙනි. එබැවින් බැංකු හා ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය විශේෂ වැදගත්කමක් දක්වා මෙම ණය වැඩසටහන යටතේ පහසුකම් සැලසිය යුතුය.

14 මෙම අවධානම් අවස්ථාවේ රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ උපදෙස් හා තීරණ වලට අනුගතවී කටයුතු කරන ලෙසත් අවධාරණය කරමි.

15 මෙම ණය වැඩසටහන යටතේ ණය මුදාහැරීම ඇදිරිනීතිය ඉවත්කල සැනකින් සමෘද්ධි බැංකුව හෝ වසම්භාර නිලධාරීන් හරහා, ප්‍රජාමූල සංවිධාන නිලධරීන්ගේ සහභාගීත්වය හා සහතිකය සඳහා අත්සන් ලබා ගැනීම සිදුකල යුතුය. මෙහිදී ණය ඉල්ලුම්පත්‍ර මුද්‍රණය කර ගැනීමට අපහසුතාවයක් පවතීනම් අදාල ගිණුම්හිමියාගෙන් ඉල්ලීමක් ලබාගෙන ණය නිකුත්කිරීම සිදුකළ හැකිය. එහිදී CR පොතක් භාවිතා කර ණය මුදල භාරගත් බවට හා භාරදුන් බවට අත්සන් ලබාගැනීම සිදුකල යුතුය. ඇදිරි නීතිය පනවා ඇති අවස්ථාවේදී ජනාධිපති ලේකම් ලබාදී ඇති උපදෙස් අනුව හදිසි කාර්යයක් ලෙස සලකා අදාල අංශ සමඟ සම්බන්ධීකරණය ඇති කර ගෙන කටයුතු කරන ලෙසත් දන්වමි.

ආර්.පී.බී.තිලකසිරි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ගරු අමාත්‍ය පවිත්‍රා දේවී වන්නිආරච්චි මැතිනිය
කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස

02. ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා
ජනාධිපති ලේකම් කාර්යාලය - කා.දැ.ස

03. ලේකම් , කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස
04. ලේකම් , සමාජ ආරක්ෂණ රාජය අමාත්‍යාංශය - කා.දැ.ස
05. විගනකාධිපති , විගනකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ස
06. ප්‍රධාන අභ්‍යන්තර විගනක සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
07. අධ්‍යක්ෂ ක්ෂුද්‍රමූල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
08. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.

09. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන් . දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
10. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් - අ.ක.ස.
11. සියළුම අංශ ප්‍රධානීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
12. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
13. සියළුම සභාපතිවරු , ප්‍රජාමූල සංවිධාන - අ.ක.ස.